

# අධ්‍යාපනය ඩිජිටල් සංවර්තනය සඳහා වූ ප්‍රතිපත්තිය

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

ICTA
ideas actioned

**2022 අප්‍රේල් 07**

මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

# පටුන

1 හැඳින්වීම ....................................................................................3
2 ප්‍රතිපත්ති අරමුණු ....................................................................................6
3 අරමුණු ....................................................................................10
3.1 අරමුණු අංක 1: අධ්‍යාපනය ඩිජිටල් සංවර්තනය කිරීම ....................................10
3.2 අරමුණු අංක 2: අනාගත අභියෝග සඳහා සූදානම් කිරීම ....................................13
3.3 අරමුණු අංක 3: කාර්යයන්හි නියුක්ත වීමෙන් ලබන ඩිජිටල් අධ්‍යාපනය ..............16
3.4 අරමුණු අංක 4: කර්මාන්ත ක්ෂේත්‍රය හා සමගාමී වීම. ....................................18
3.5 අරමුණු අංක 5: සිසුන් සඳහා ඩිජිටල් පරිසරයක් ....................................19
3.6 අරමුණු අංක 6: ඩිජිටල් අධ්‍යාපනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඉගෙනුම් මූලාශ්‍ර ....................................20
3.7 අරමුණු අංක 7: ඉගෙනුම් කළමනාකරණ පද්ධති ....................................21
3.8 අරමුණු අංක 8: ස්වයං ඉගෙනුම හා ඒ සඳහා පහසුකම් සැලසීම ....................................22
3.9 අරමුණු අංක 9: මෘදු කුසලතා සංවර්ධනය ....................................23
3.10 අරමුණු අංක 10: අධ්‍යාපන ආයතන සඳහා ඩිජිටල් කළමනාකරණ තොරතුරු පද්ධති ....................................24
3.11 අරමුණු අංක 11: පරිපාලන කාර්ය මණ්ඩලයේ ඩිජිටල් කුසලතා ....................................25
3.12 අරමුණු අංක 12: මාර්ගගත ඉගෙනුම ....................................26
3.13 අරමුණු අංක 13: ඩිජිටල් මෙවලම් භාවිතා කිරීමේ කුසලතා (ගුරුවරුන්/අධ්‍යයන කාර්ය මණ්ඩලය) ....................................30
3.14 අරමුණු අංක 14: ඩිජිටල් මෙවලම් භාවිතය පිළිබඳ කුසලතා (ශිෂ්‍යයන්) ............31
3.15 අරමුණු අංක 15: ඩිජිටල් අවකාශය තුළ සුරක්ෂිත බව ....................................32
3.16 අරමුණු අංක 16: දෙමාපියන්/භාරකරුවන් දැනුවත් කිරීම. ....................................33
3.17 අරමුණු අංක 17: තිරසර හා පරිසර හිතකාමී ඩිජිටල් සංවර්තනය ....................................34
3.18 අරමුණු අංක 18: මෘදුකාංග භාවිතය ....................................35
3.19 අරමුණු අංක 19: ඩිජිටල් සංවර්තනයට ප්‍රමුඛතාව ....................................36



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

# 1 හැඳින්වීම

වර්තමාන තොරතුරු යුගයේ දැනුම්පාදක වෘත්තීන්හි අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ ශීඝ්‍රයෙන් වෙනස් වන අවශ්‍යතාවලට අනුගත විය හැකි ශක්තිමත් හා නම්‍යශීලී මානව ප්‍රාග්ධනයක් නිර්මාණය කිරීම යි. ඒ සඳහා අධ්‍යාපන පද්ධතිය ප්‍රමාණවත් හා ශක්තිමත් වීම අත්‍යවශ්‍ය වන අතර 21වන සියවසේ සමාජයීය හා වෘත්තීමය අභියෝග ජය ගැනීම සඳහා ඉගෙනුම්ලාභීන්ට ප්‍රමාණවත් නිපුණතා ලබා දීමට පාසල්, වෘත්තීය හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල පහසුකම් පුළුල් හා ප්‍රබල මට්ටමක පැවැතිය යුතු ය.

මෙම අභියෝගයට සාර්ථක ව මුහුණ දීම සඳහා සියලු අධ්‍යාපන ආයතන නවීන තාක්ෂණයෙන් බල ගැන්විය යුතු අතර ඊට සමගාමී ව ගුරු භවතුන් ඇතුළු සියලු අධ්‍යාපන වෘත්තිකයින්ගේ ධාරිතා සංවර්ධනය සිදු කිරීම ද වැදගත් ය.

යාවජීව අධ්‍යාපනයේ ප්‍රමුඛ නිපුණතා අත්පත් කර ගැනීම සඳහා උසස් තත්ත්වයේ සමසාධාරණ අධ්‍යාපන ප්‍රවේශයක් පැවැතිය යුතු අතර ඒ සඳහා නිවැරැදි ප්‍රතිපත්ති සම්පාදනය කිරීම කාලීන අවශ්‍යතාවකි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල බොහෝ වුව ද ප්‍රායෝගික තත්ත්වය සැලකීමේ දී සාම්ප්‍රදායික ඉගෙනුම් පරිසරයක් එම සියලු අවශ්‍යතා සඳහා නොගැළපිය හැකි ය. විශේෂයෙන් ම ස්වාභාවික අපාදා, දීර්ඝ කාලීන වසංගත, ආර්ථික අර්බුද වැනි පොදුවේ රටට ම / ලෝකයට ම බලපාන හදිසි තත්ත්ව හමුවේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමවේදය අඛණ්ඩ ව පවත්වාගෙන යාම දැවැන්ත අභියෝගයකි. එවැනි අභියෝගාත්මක වාතාවරණ හමුවේ සියලු සිසුනට සමාන හා සම අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය තහවුරු කිරීම අධ්‍යාපන බලධාරීන්ගේ වගකීම යි.

පශ්චාත් කොවිඩ් - 19 සමයේ මාර්ගගත ලෙස අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමේ දී මතු වූ ප්‍රායේගික ගැටලු මීට උදාහරණ ලෙස දැක්විය හැකි ය. එවැනි වාතාවරණයක අධ්‍යාපනය සඳහා පවතින එක ම විකල්පය ලෙස මාර්ගගත අධ්‍යාපනය නොසැලකිය හැකි වුව ද අන්තර්ජාල පහසුකම් නොමැති වීම, සංඥා ආවරණ නොපැවතීම, පරිගණක උපාංගයක් නොමැති වීම වැනි ප්‍රායෝගික ගැටලු මත බොහෝ සිසුන් අධ්‍යාපන ක්‍රියාවලියෙන් බැහැර වූ බව නොරහසකි. මෙය වසංගත තත්ත්වයක් හේතුවෙන් කරලියට පැමිණිය ද අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා තාක්ෂණය භාවිතය ආරම්භයේ සිට ම පවතින හා වර්ධනය වූ ගැටලුකාරී තත්ත්වයකි. එවැනි ගැටලුවක් ඉදිරියේ දී මතු නොවීමට නම් ක්‍රමවත් වැඩපිළිවෙලත් යටතේ සියලු පාර්ශවවල මැදිහත් වීමෙන් අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කඩිනම් කළ යුතු ය. මෙය අධ්‍යාපනයට අදාළ ආයතන මගින් පමණක් තනි ව සිදු



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

කළ නොහැකි කාර්යයක් වන අතර ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේ ම සෘජු මැදිහත් වීම අනිවාර්යයෙන් ම සිදු විය යුතු ය.

නිදහස් අධ්‍යාපන ප්‍රවේශය තුළ අධ්‍යාපනයට තාක්ෂණය භාවිතය, මාර්ගගත ඉගෙනීම වැනි ක්‍රමවේද උදෙසා රජය මගින් මෙන් ම දෙමාපියන් විසින් ද යම්කිසි මූල්‍යමය දායකත්වයක් සිදු කෙරේ. ඩිජිටල් අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම්, මාර්ගෝපදේශ හා සම්පත් සම්පාදනය සම්බන්ධයෙන් පැහැදිලි නිර්ණායක හා උපදෙස් ලබා දීම මෙම ප්‍රතිපත්ති සංග්‍රහයේ අරමුණ යි.

ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා එක් ව අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, වෘත්තීයවේදීන්, විදුහල්පතිවරුන්, පාසල් ගුරුවරුන්, වෘත්තීය හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන්, නිලධාරීන් සහ දේශකවරුන්, තාක්ෂණ විශේෂඥයින් ආදීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද වැඩමුළු කිහිපයක ප්‍රතිඵල මත මෙම ප්‍රතිපත්ති යෝජනා සකස් කරන ලදි.

මෙම පසුබිම යටතේ සංගෘහිත මතු දැක්වෙන ප්‍රතිපත්ති යෝජනාවලියේ සාර්ථකත්වයට පහත දැක්වෙන ආයතනවල සෘජු දායකත්වය සහ ආශිර්වාදය නිසැක පිටිවහලක් වූ බව කෘතවේදී ව සඳහන් කළ යුතු ය.

- අධ්‍යාපන අමාත්‍යාංශය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියොජිතායතනය (ICTA)
- අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් සියලු රාජ්‍ය අමාත්‍යාංශ
- අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන (ජාතික අධ්‍යාපන කොමිසම, ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ....... )
- පාසල්
- විශ්වවිද්‍යාල
- නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන ආයතන

ඒ අනුව අධ්‍යාපන ආයතන ලෙස ක්‍රියාත්මක වන මෙම ආයතන වර්තමානයේ මුහුණ පා ඇති ගැටලුවලට අදාළ ව මෙහි දී සාකච්ඡා කර අවශ්‍ය ප්‍රතිපත්ති, යෝජනා හා ක්‍රමෝපාය ඉදිරිපත් කර ඇත.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

මෙම ප්‍රතිපත්ති සංග්‍රහය සකස් කිරීමේ දී පහත පොදු යෙදුම් භාවිත කර ඇත.

- අධ්‍යාපන ආයතන

  අධ්‍යාපන ක්‍රියාවලියේ නිරත පාසල්, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන, නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන ආයතන ආදි සියලු ආයතන ‘අධ්‍යාපන ආයතන’ ලෙස හඳුන්වා ඇත.

- සිසුන්

  මෙහි ‘සිසුන්’ යන ශීර්ෂය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ පාසල් සිසුන්, උසස් අධ්‍යාපනය හදාරන හා විශ්වවිද්‍යාල සිසුන් සහ වෘත්තීය හා තෘතීය අධ්‍යාපනයේ නිරත සිසුන් අදහස් වේ.


- ගුරුවරුන්

  ‘ගුරුවරුන්’යන ශීර්ෂය යටතේ පාසල් ගුරුභවතුන්, විශ්වවිද්‍යාල ආචාර්ය, මහාචාර්ය, කථිකාචාර්යවරුන්, වෘත්තීය අධ්‍යාපන ආයතන හා කාර්මික විද්‍යාල වැනි ආයතනවල කථිකාචාර්යවරුන් / දේශකවරුන් ඇතුළු ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත සියලු පාර්ශව ඇතුළත් කර ඇත.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

# 2 ප්‍රතිපත්ති අරමුණු




අධ්‍යාපනය ඩිජිටල් සංවර්තනය කිරීම සඳහා ප්‍රතිපත්තියක් හඳුන්වාදීමේ සමස්ත අරමුණු ලෙස පහත දැක්වෙන කරුණු හඳුනාගෙන තිබේ.

1. එය ප්‍රාථමික ,ද්විතීක හෝ තෘතීක වුව ද ඩිජිල්කරණයේ දී බාධා මතුවන නමුත් ඒ සමගම ප්‍රතිලාභ ද අත්කර ගනී.ඉහළ මට්ටමේ සංවර්ධනය හා වෙනස්වීම්වලට සමගාමී ව වෙනස් වන අධ්‍යාපනය නව තාක්ෂණික ප්‍රවණතා සහ නව්‍ය යෙදවුම්වල උපරිම උපයෝජනය අත්පත් කර ගනී.

2. වර්තමාන දේශීය හා ජාත්‍යන්තර රැකියා වෙළෙඳ පොළ අභියෝග ජය ගත හැකි පුහුණුවක් සහිත යාවත්කාලීන උසස් අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීම. ඔවුන් සෑම විටම ලෝකයේ ඕනෑම ස්ථානයක ජීවත් වන සිසුන්ට වඩා ඉහළ / සමාන මට්ටමේ ඩිජිටල් කුසලතාවන්ගෙන් සමන්විත වීම.

3. ශිෂ්‍යයාට ලබා දෙන ඩිජිටල් අධ්‍යාපනය හුදෙක් න්‍යායාත්මක අධ්‍යාපනයට පමණක් සීමා නොකරමින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා සිසුන්ට ප්‍රමාණවත් අවස්ථා ලබා දිය යුතුය. සෑම සිසුවෙකුට ම, ඔහු/ඇය හදාරන විෂයධාරාව කුමක් වුවත්, එම විෂයමාලාවේ අනිවාර්යය සංරචකයක් ලෙස ඩිජිටල් කුසලතා වර්ධනය ඇතුළත් විය යුතු ය. ප්‍රායෝගික සංරචකයකින් තොරව ඩිජිටල් අධ්‍යාපනය අංගසම්පූර්ණ නොවේ. පාඨමාලාවේ ස්වභාවය



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

අනුව එහි විෂය නිර්දේශයේ 10% කට වඩා වැඩි කාලයක් සිසුන්ගේ ඩිජිටල් කුසලතා වර්ධනය සඳහා වෙන් කිරීම.

4. සිසුන්ට පරිපූර්ණ, උසස් සහ යාවත්කාලීන කළ අධ්‍යාපනයක් ලබා දීම සඳහා සෑම අධ්‍යාපන ආයතනයක ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය හා ඒ ආශ්‍රිත විෂයන් උගන්වන අධ්‍යයන කාර්ය මණ්ඩලය නව තාක්‍ෂණික සංවර්ධනයට, කාර්මික ක්ෂේත්‍රයේ නව ප්‍රවනතාවලට සමගාමීව තම කුසලතා වර්ධනය කර ගැනීම සඳහා ඉගැන්වීම් ක්‍රම නිතර යාවත්කාලීන කිරීම.

5. සෑම අධ්‍යාපන ආයතනයකම හා වෘත්තීය පුහුණු ආයතනයකම ශිෂ්‍ය කේන්ද්‍රීය ඩිජිටල් අධ්‍යාපනයක් සහිත පරිසරයක් පැවතීම. සියලු උපාංගවලින් සමන්විත පරිගණක විද්‍යාගාර සපයා දීමෙන් සිසුන්ට ප්‍රමාණවත් සහ සමාන අවස්ථා සලසමින් ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම.

6. ශිෂ්‍යයන්, ප්‍රාථමික, ද්විතීයික හෝ තෘතීයික මට්ටම්වල ඉගෙනුම ලැබුව ද, ඔවුන්ගේ ඉගෙනුම් කටයුතු සඳහා අවශ්‍ය ඉගෙනුම් මූලාශ්‍ර (පොත්, සඟරා, වීඩියෝ ආදිය) දැරිය හැකි මිලකට සපයා ගැනීම. එම මූලාශ්‍ර අවශ්‍යතාවයට ගැළපෙන පරිදි ගුණාත්මක තත්ත්වයෙන් පැවතීම හා යාවත්කාලීන විය යුතුය.

7. සෑම අධ්‍යාපන ආයතනයක් ම අධ්‍යාපන ක්‍රියාවලියේ විශිෂ්ටත්වය සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMSs) භාවිතා කිරීම.

8. ඩිජිටල් අධ්‍යාපනය පන්ති කාමරවලට පමණක් සීමා කළ නොහැකි අතර එසේ සීමා කළ යුතු ද නැත. එහෙත් ඩිජිටල් තාක්ෂණ කුසලතා සහිත අනාගත වෘත්තිකයන් බවට පත් වීම සඳහා ප්‍රධාන විෂයන් පිළිබඳව මෙන්ම අනෙකුත් විෂය ක්ෂේත්‍රවලට අදාළ ව තම දැනුම වැඩිදියුණු කරගනිමින් ස්වයං අධ්‍යනයේ යෙදීමට සිසුන් උනන්දු කරවීම.

9. මෘදු කුසලතා සංවර්ධනය ඩිජිටල් අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය සංරචකයකි. ඩිජිටල් අධ්‍යාපනයේදී දෘඪ කුසලතා හා සමගාමීව සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනයක් ද සිදුවිය යුතුය. සන්නිවේදන කුසලතා , අන්තර් පුද්ගල සබඳතා, ඉදිරිපත් කිරීමේ කුසලතා, කණ්ඩායම් හැඟීම, නායකත්වය කුසලතා ආදිය මෘදු කුසලතා යටතට ගැනේ.

10. සියලු ම අධ්‍යාපන ආයතනවල පරිපාලන හා කළමනාකරණ කටයුතු සඳහා අංගසම්පූර්ණ කළමනාකරණ තොරතුරු පද්ධති භාවිතා කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

11. සියලු ම අධ්‍යාපන ආයතනවල පරිපාලකයින්ට සිය දෛනික කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය පද්ධති හා යෙදවුම් මෙහෙයවීමට අවශ්‍ය ඩිජිටල් කුසලතා පිළිබඳව නිපුනත්වයක් ලබා දීම.

12. සාමාන්‍ය ක්‍රමවේදය යටතේ අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවල ඉගෙනුම් ක්‍රියාකාරකම් ආවරණය කිරීම සඳහා සියලු සිසුන්ට පහසුකම් පැවතිය යුතුය. එහිදී භූගෝලීය පිහිටීම, ආර්ථිකය මත සමාජීය මට්ටම නොසලකා සම්ප්‍රදායික පන්තිකාමර අධ්‍යාපනයට සමීප අඛණ්ඩ හා විධිමත් අධ්‍යාපනයක් මාර්ගගත ව ලබා දීමට අවශ්‍ය යටිතල පහසුකම් (උපකරණ හා උපාංග, සංඥා ආවරණ, අන්තර්ජාල පහසුකම් ආදිය) රජය මගින් සම්පාදනය කිරීම.

13. සියලු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාවලින් සන්නද්ධ වීම. තව ද ඔවුන්ට ඉගැන්වීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් ඩිජිටල් මෙවලම් හා මෘදුකාංග ලබා දීම.

14. සියලු සිසුන් අධ්‍යාපන ක්‍රියාවලියට ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීමට අවශ්‍ය හැකියාව ලබා ගැනීම.

15. ගුරුවරුන් හා පරිපාලකයින් විසින් සයිබර් අනතුරු හඳුනා ගැනීම මගින්, අධ්‍යාපනය සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිත කරන සියලු සිසුන්ට සුරක්ෂිත ඩිජිටල් අවකාශයන් තහවුරු කිරීම හා ඒ සඳහා විධිමත් රැකවරණයක් සැපයීම.

16. දෙමාපියන් සහ භාරකරුවන් ඩිජිටල් අධ්‍යාපනයේ අවශ්‍යතාව පිළිබඳව දැනුවත් වී ඒ සඳහා හිතකර පරිසරයක් නිවස තුළ සකස් කිරීම සහ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා හැකි උපරිම සහය දැක්වීම.

17. සෑම අධ්‍යාපන ආයතනයක් ම තිරසර හා පරිසර හිතකාමී ඩිජිටල් සංවර්තන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සහ විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කිරීම.

18. අධ්‍යාපන ආයතනවල ඉගෙනුම් ක්‍රියාකාරකම් සහ කළමනාකරණයට භාවිත කරන මෘදුකාංග අදාළ කාර්යයට ගැළපෙන ප්‍රයෝජනවත් ,යාවත්කාලීන සහ බලපත්‍ර සහිත (විවෘත හා නිදහස් මෘදුකාංග හැර) මෘදුකාංග වීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

19. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයින් ක්‍රියාත්මක කරන්නන් ඇතුළු තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සිටින සියලු පාර්ශවකරුවන් අධ්‍යාපන ඩිජිටල් සංවර්තන ක්‍රියාවලියට නිසි ප්‍රමුඛතාවය ලබා දීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

# 3 අරමුණු

## 3.1 අරමුණු අංක 1: අධ්‍යාපනය ඩිජිටල් සංවර්තනය කිරීම

අධ්‍යාපනය : එය ප්‍රාථමික ,ද්විතීක හෝ තෘතීක වුව ද ඩිජිල්කරණයේ දී බාධා මතුවන නමුත් ඒ සමගම ප්‍රතිලාභ ද අත්කර ගනී. ඉහළ මට්ටමේ සංවර්ධනය හා වෙනස්වීම්වලට සමගාමී ව වෙනස් වන අධ්‍යාපනය නව තාක්ෂණික ප්‍රවණතා සහ නව්‍ය යෙදවුම්වල උපරිම උපයෝජනය අත්පත් කර ගනී.

**ප්‍රතිපත්ති ගැටලු අංක 1.1:**

රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන සෞභාග්‍යයේ දැක්ම මගින් රජය ,ආර්ථිකය හා සමාජය පූර්ණ ඩිජිටල් සංවර්තන පරිවර්තනයකට මෙහෙයවනු ලැබේ. මෙම පරිවර්තනයේ ඒකාබද්ධ කොටස් කරුවන් වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය,සියලු ම අධ්‍යාපන ආයතන මෙම පරිවර්තනය මෙහෙයවන වෙනත් රාජ්‍ය ආයතන සමඟ ඵලදායී සම්බන්ධතා ගොඩනගා ගනිමින් මෙහි පාර්ශවකරුවන් ලෙස ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍ය වේ.

**ප්‍රතිපත්ති අංක 1.1:**

අධ්‍යාපන අමාත්‍යාංශය හා සියලු ම අධ්‍යාපන ආයතන විසින් මෙම ඩිජිටල් පරිවර්තනයේ අවශ්‍යතාව හඳුනාගෙන එහි පාර්ශවකරුවකු විය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු සියලු ම රාජ්‍ය අධ්‍යාපන ආයතන මගින් උපාය මාර්ගික මට්ටමේ දී ඩිජිටල් පරිවර්තනයේ අවශ්‍යතාව සහ ඒ සඳහා අනුගත වීමේ උපායමාර්ග හදුනාගෙන එය ස්වකීය උපාය මාර්ගික හා ක්‍රියාකාරී සැලසුම්වල අන්තර්ගත කිරීම.
2. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඩිජිටල් පරිවර්තනය සඳහා ක්‍රියාත්මක වීමේ දී තාක්ෂණ අමාත්‍යාංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සහ වෙනත් අදාළ ආයතන (උදා: ශ්‍රී ලංකා විදුලි සංදේශ හා නියාමන කොමිෂන් සභාව) සමඟ සමීප සබඳතා පැවැත්වීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 1.2:**

වෙනස් වීම සඳහා ප්‍රතිරෝධය දැක්වීම මිනිස් ස්වභාවයයි. යමෙකු විසින් මේ වන විට අත්කරගෙන ඇති කුසලතා ඩිජිටල් සංවර්තනය නිසා යල්පැන යන බවට හැඟීමක් ඇතිවුවහොත් මෙය වඩාත් ඉස්මතු වේ.මේ නිසා වෘත්තීය සංවර්ධනය සඳහා නව කුසලතා අත්පත් කර ගතයුතු නමුත් එය බොහෝ දෙනෙකු විසින් තමන් කිසිදු සූදානමක් නැති අභියෝගයක් සේ සලකනු ලබයි.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

**ප්‍රතිපත්ති අංක 1.2:**

විවිධ පාර්ශ්වකරුවන් විසින් ඩිජිටල් පරිවර්තනය කෙරෙහි දක්වන ප්‍රතිරෝධය සඳහා දැඩි නීතිරීති මගින් විසඳුම් ලබා දීම වෙනුවට වඩා සුහදශීලී ප්‍රවේශයක් ඔස්සේ ඔවුන්ගේ සැබෑ ගැටලු අවබෝධ කර ගනිමින් ඒවාට නිසි ප්‍රායෝගික විසඳුම් ලබා දිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. ඩිජිටල් පරිවර්තනය කෙරෙහි අධ්‍යාපනඥයින්, නිලධාරීන් සහ දෙමාපියන් විසින් දක්වන ප්‍රතිරෝධය සඳහා විසඳුම් ලබා දිය යුත්තේ:
2. ඩිජිටල් කුසලතා ඉලක්ක කරගත් වාර්ෂික තක්සේරුකරණය
3. ඩිජිටල් විසඳුම් භාවිතය සඳහා දිරිමත් කිරීම සහ එම කුසලතා අත්පත් කර ගැනීම සඳහා ගුරුභවතුන්ට අවස්ථා සම්පාදනය කිරීම(උසස්වීම්,පුහුණුවීම් ආදිය ලබා දීම)
4. සිසුන්,දෙමාපියන් සහ මහජනතාව ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් හා වෙනස්වීම් කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගිනි.

**ප්‍රතිපත්තිමය ගැටලුව 1.3:**

අධ්‍යාපනය ඩිජිටල් සංවර්තනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් මූලික එකඟතාව ලබා දුන්න ද, එය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ දී අරමුදල් සපයා ගැනීමේ ගැටලු ඇති වීම.

**ප්‍රතිපත්ති අංක1.3:**

අරමුදල් හිඟකම අධ්‍යාපන ආයතන්හි ශිෂ්‍ය කේන්ද්‍රීය ඩිජිටල් අධ්‍යාපන විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා බාධාවක් නොවිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. ජාතික අධ්‍යාපන අයවැයක් මගින් ප්‍රතිපාදන සලසමින් අධ්‍යාපන ආයතනයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිසරයක් ගොඩනැගීමේ දී ඇතිවන අරමුදල් ගැටලුව සඳහා විසඳුම් ලබා දීම.
2. ප්‍රජාවට තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය ලබා දීමේ අරමුණින් පාසල් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (අවම වශයෙන් කිහිපයක්වත්) ලාභ ඉපයීම මගින් ස්වයං තිරසර ඉගෙනුම් මධ්‍යස්ථාන බවට පත් කිරීම.
3. ඩිජිටල් විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් ආයතන සතු අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා, මාර්ගගත ප්‍රවේශයට ( On line platforms) දත්ත සඳහා මුදල් වැයවීමකින් තොරව පිවිසීමේ හැකියාව (white-listed) සහතික කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සහ ඉ-තක්සලාව (e-thaksalawa), meet.gov.lk වැනි දේශීයව සකස් කර ඇති යෙදවුම් ප්‍රවර්ධනය කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

විශ්වවිද්‍යාල ද UBL (University Business Link) හරහා අදාළ ආයතන සම්බන්ධීකරණයෙන් සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීම හෝ වෙනත් විකල්ප සලසා ගැනීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.2 අරමුණු අංක 2: අනාගත අභියෝග සඳහා සූදානම් කිරීම

වර්තමාන දේශීය හා ජාත්‍යන්තර රැකියා වෙළෙඳ පොළ අභියෝග ජය ගත හැකි පුහුණුවක් සහිත යාවත්කාලීන උසස් අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීම. ඔවුන් සෑම විටම ලෝකයේ ඕනෑම ස්ථානයක ජීවත් වන සිසුන්ට වඩා ඉහළ/ සමාන මට්ටමේ ඩිජිටල් කුසලතාවන්ගෙන් සමන්විත වීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක2.1:**
කර්මාන්ත ක්ෂේත්‍රයෙහි සිදු වන සැලකිය යුතු වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස දේශීය හා ජාත්‍යන්තර රැකියා වෙළෙඳපොළ ඉල්ලුම නිරන්තර හා අඛණ්ඩ පරිවර්තනයකට ලක් වේ. සිසුන් විසින් අත් කර ගත යුතු පුහුණුව කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉල්ලුමට අනුරූප විය යුතු අතර එසේ නොවුණහොත්, සේවායෝජකයින්ගේ අවධානය දිනා ගැනීම ඔවුන්ට අපහසු වනු ඇත. මෘදු සහ දෘඪ කුසලතාවන්හි නිපුණත්වය, තාක්ෂණික පරාසයක් තුළ ලබා ඇති පළපුරුද්ද, අඛණ්ඩ අධ්‍යාපනය සඳහා ඇති කැමැත්ත සහ වැඩ කිරීම කෙරෙහි දක්වන ධනාත්මක ආකල්ප වැනි ගුණාංග සඳහා වෙළෙඳපොළ ඉල්ලුම පවතී. අධ්‍යාපන ක්‍රියාවලිය මගින් සිසුන්ට එම කුසලතා අත්පත් කර දීම අධ්‍යාපන බලධාරීන්ට මුහුණ දීමට සිදු වී ඇති අභියෝගය වේ.

**ප්‍රතිපත්ති අංක 2.1:**
සෑම විටම දේශිය හා ජාත්‍යන්තර රැකියා වෙළඳ පොළෙහි වර්තමාන සහ අනාගත කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය කුසලතාවලට සමගාමීව ඩිජිටල් අධ්‍යාපනය වෙනස් විය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. සියලු ම අධ්‍යාපන ආයතන නව පාඨමාලා, මොඩියුල අදිය සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ දී ඒවා විශිෂ්ට, යාවත්කාලීන හා කර්මාන්ත ක්ෂේත්‍රයේ අභියෝගවලට ගැළපෙන අයුරින් සකස් කිරීමට ප්‍රයත්න දැරීම.
2. සියලු ම අධ්‍යාපන ආයතන සිය විෂය නිර්දේශ කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතාවනට අනුකූලවන පරිදි නිරන්තර සමාලෝචනය කිරීම.
3. සියලු ම අධ්‍යාපන ආයතන විසින් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා වෙනත් අධ්‍යාපන ආයතන මගින් සකස් කරනු ලබන මොඩියුල, දේශීය වශයෙන් යොදා ගැනීමේ අරමුණින් නිරන්තරයෙන් පර්යේෂණ සිදු කිරීම.
4. විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන මගින් කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවණතා පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයේ හවුල්කරුවන් සමඟ නිරන්තර සාකච්ඡා පැවැත්වීම.
5. සියලු ම අධ්‍යාපනික ආයතන තම කාර්ය මණ්ඩලය දේශීය හා විදේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ පුහුණුව හා අත්දැකීම් ලබා ගැනීම සඳහා යොමු කිරීම.


මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

**ප්‍රතිපත්ති ගැටලු අංක 2.2:**
ඩිජිටල් අධ්‍යාපනය විශිෂ්ට වීමට නම් එය නිරන්තරයෙන් පරිණාමනය විය යුතුය. මෙමගින් නව සංවර්ධන ප්‍රවණතා විෂයය නිර්දේශයන්හි ඇතුළත් වීමට අවස්ථා දිය හැකිය. එහෙත් මෙම ක්‍රියාවලියේ අඩුලුහුඩුකම් පවතින බව ප්‍රායෝගික තත්ත්වයේ දී නිරතුරුව නිරීක්ෂණය වේ . උදාහරණයක් ලෙස කිසිදු වැඩිදියුණු කිරීමකින් හෝ වෙනස් කිරීමකින් හෝ තොරව එකම විෂය නිර්දේශය දීර්ඝ කාලයක් භාවිත කරණු දැක්විය හැකි ය.

**ප්‍රතිපත්ති අංක 2.2:**
නව ඩිජිටල් සංවර්ධනයන්ට සමගාමී ව විෂය නිර්දේශ නිශ්චිත කාලරාමු තුළ නිරන්තර ව යාවත්කාලීන කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. ප්‍රායෝගික තක්සේරුකරණ හා ඇගයීම් ක්‍රමවේද පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් විෂය නිර්දේශ නිරන්තර සංශෝධනයට ලක් කිරීම. (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයන්)
2. ප්‍රායෝගික කත්සේරුකරණ හා ඇගයීම් ක්‍රමවේද පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් විෂය නිර්දේශ නිරන්තර සංශෝධනයට ලක් කිරීම. (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයන් තක්සේරුකරණයේ දී වර්තමානයේ දී සිදු කරනු ලබන ලිඛිත පරීක්ෂණ පමණක් පැවැත්වීම වෙනුවට අවම වශයෙන් 30% - 40% ක ප්‍රමාණයක්වත් ප්‍රායෝගික ඇගයීම් ලෙස සිදු කිරීම සුදුසු බව නිර්දේශ කෙරේ)
3. ප්‍රායෝගික ඇගයිම් සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැපයීම. (යටිතල පහසුකම් හා වෙනත් සුදුසු විසඳුම් සංවර්ධනය / වැඩි දියුණු කිරිම)



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

**ප්‍රතිපත්ති ගැටලු අංක 2.3:**
විශේෂයෙන් වෘත්තීය අධ්‍යාපනයේ දී සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශන පහසුකම් සුලභව නොමැති බව නිරීක්ෂණය වේ. ඇතැම් විට පාසල් අධ්‍යාපනයේදීත් මෙය සිදුවේ. වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව වඩාත් සුදුසු වෘත්තියකට ප්‍රවේශ වීමේ අවස්ථා මේ නිසා මගහැරේ.

**ප්‍රතිපත්ති අංක 2.3:**
වෘත්තීය පුහුණු පාඨමාලා අවසන් වීමෙන් පසුව තෘතීය අධ්‍යාපනයට හෝ කර්මාන්ත ක්ෂේත්‍රයට හෝ ඇතුළත් වීමට පෙර සියලු සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශ අනිවාර්යයයෙන් ලබා දීමේ අවශ්‍යතාව හඳුනා ගත යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. සෑම ද්විතියීක පාසලක ම වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන පිහිටුවීම.
2. ශ්‍රම වෙළෙඳපොළේ පවතින වෘත්තීය අවස්ථා පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා පාසල්වල ද්විතියීක ශ්‍රේණි ගුරුවරුන්ට අවස්ථාව ලබා දීම.
3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් බලගැන්වුණ වෘත්තීය මාර්ගෝපදේශන පද්ධති මාර්ගගත ඉගෙනුම් ප්‍රවේශ (Online learning platform) සමග සම්බන්ධ කිරීම.
4. මාර්ගගත ප්‍රවේශ ඔස්සේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සවිබලගැන්වුණ වෘත්තීය මාර්ගෝපදේශ ක්‍රමවේද සම්බන්ධ කිරීම.
5. මාර්ගගත ප්‍රවේශ ඔස්සේ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ඉදිරිපත් කිරීම


මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.3 අරමුණු අංක 3: කාර්යයන්හි නියුක්ත වීමෙන් ලබන ඩිජිටල් අධ්‍යාපනය

ශිෂ්‍යයාට ලබා දෙන ඩිජිටල් අධ්‍යාපනය හුදෙක් න්‍යායාත්මක අධ්‍යාපනයට පමණක් සීමා නොකරමින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා සිසුන්ට ප්‍රමාණවත් අවස්ථා ලබා දිය යුතුය. සෑම සිසුවෙකුට ම, ඔහු/ඇය හදාරන විෂයධාරාව කුමක් වුවත්, එම විෂයමාලාවේ අනිවාර්යය සංරචකයක් ලෙස ඩිජිටල් කුසලතා වර්ධනය ඇතුළත් විය යුතු ය. ප්‍රායෝගික සංරචකයකින් තොරව ඩිජිටල් අධ්‍යාපනය අංගසම්පූර්ණ නොවේ. පාඨමාලාවේ ස්වභාවය අනුව එහි විෂය නිර්දේශයේ 10% කට වඩා වැඩි කාලයක් සිසුන්ගේ ඩිජිටල් කුසලතා වර්ධනය සඳහා වෙන් කිරීම.

### ප්‍රතිපත්ති ගැටලු අංක 3.1:

විවිධ හේතු මත සෑම මට්ටමක ම පාසේ සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා අවස්ථාව සෑම විට ම නොසැපයේ. විශේෂයෙන්ම උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන මට්ටම්වල පාඨමාලා සකස් කිරීමේ දී ඩිජිටල් අධ්‍යාපනය කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වා නොමැති වීමෙන් වත්මන් රැකියා වෙළඳ පොළ ජයගැනීම සහ තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය ඩිජිටල් කුසලතා අත්පත් කර ගැනීමෙන් තොරව සිසුන් විසින් මෙම පාඨමාලා අවසන් කරනු ලැබේ. තවද ඇතැම් පාඨමාලා ඩිජිටල් අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා නොදෙන බව ද නිරීක්ෂණය වේ.

### ප්‍රතිපත්ති අංක 3.1:

ප්‍රාථමික,ද්වීතීක හා තෘතීක මට්ටම්වල දී ප්‍රායෝගික අත්දැකීමක් සෑම සිසුවෙකුටම ලබා දීම ඩිජිටල් අධ්‍යාපනයේ මූලික හා අත්‍යවශ්‍ය සංරචකයකි. සෑම සිසුවෙකුට ම මෙම පහසුකම සැලසීම තහවුරු කළ යුතුය . සෑම සිසුවෙකුටම, ඔහු/ඇය හදාරන අධ්‍යයන විෂය ධාරාව කුමක් වුවත්, ප්‍රමාණවත් කාලයක් සහිතව, විෂයමාලාවේ මූලික සංරචකයක් ලෙස, ඩිජිටල් කුසලතා වර්ධනය කර ගැනීම සඳහා අවස්ථාව සම්පාදනය කළ යුතුය.

### ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:

1. ප්‍රාථමික, ද්විතියික හෝ තෘතීයික මට්ටම්වල සෑම ඩිජිටල් අධ්‍යාපන පාඨමාලාවකම ප්‍රධාන සංරචකයක් ලෙස ප්‍රායෝගික පුහුණුව අඩංගු කිරීමට පියවර ගත යුතු ය.
2. මෙම අවශ්‍යතාව සපුරා ඇති බව තහවුරු කර ගැනීම සඳහා අවම වශයෙන් සෑම වසර තුනකට වරක්වත් පාඨමාලා අන්තර්ගත සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි යාවත්කාලීන කිරීම.
3. පාඨමාලා මගින් ලබා දෙන ප්‍රායෝගික පුහුණුව සම්බන්ධයෙන් ප්‍රතිපෝෂණ දැක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දීම හා ඔවුන් විසින් ඉදිරිපත් කරණු ලබන පැමිණිලි සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

4. අධ්‍යාපන බලධාරීන් විසින් සෑම මට්ටමක ම සිසුන්ට ප්‍රායෝගික ඩිජිටල් කුසලතා වර්ධනය සඳහා අවශ්‍ය සම්පත් සපයා දීම.


මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.4 අරමුණු අංක 4: කර්මාන්ත ක්ෂේත්‍රය හා සමගාමී වීම.

සිසුන්ට පරිපූර්ණ, උසස් සහ යාවත්කාලීන කළ අධ්‍යාපනයක් ලබා දීම සඳහා සෑම අධ්‍යාපන ආයතනයක ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය හා ඒ අශ්‍රිත විෂයන් උගන්වන අධ්‍යයන කාර්ය මණ්ඩලය නව තාක්‍ෂණික සංවර්ධනයට, කාර්මික ක්ෂේත්‍රයේ නව ප්‍රවනතාවලට සමගාමීව තම කුසලතා වර්ධනය කර ගැනීම සඳහා ඉගැන්වීම් ක්‍රම නිතර යාවත්කාලීන කිරීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක4.1:**

සමහර කථිකාචාර්යවරුන් සහ පුහුණුකරුවන් කාර්මික ක්ෂේත්‍රය සමඟ සමීප සබඳතා නොපවත්වන බව නිරීක්ෂණය වී ඇති අතර, එමඟින් අනාගත ඩිජිටල් ශ්‍රම බලකාය ගොඩනැගීමට අත්‍යවශ්‍ය වටිනා දායකත්වය ලබා දිය නොහැකි වීම.

**ප්‍රතිපත්ති අංක 4.1:**

සෑම විශ්වවිද්‍යාලයක ම සහ වෘත්තීය පුහුණු ආයතනයක ම අදාළ සියලු ම කථිකාචාර්යවරුන් සහ පුහුණුකරුවන් කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ සමීප සබඳතා පවත්වා ගත යුතු අතර සෑම විට ම කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට සමගාමීව ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. සෑම අධ්‍යාපන ආයතනයක් විශේෂයෙන් විශ්වවිද්‍යාල හා වෘත්තීය පුහුණු ආයතන විසින් ඔවුන්ගේ එක් එක් පාඨමාලා කර්මාන්ත ක්ෂේත්‍රය සමග සම්බන්ධ කිරීමට සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපනය කිරීම.
2. අවම වශයෙන් වසර 3කට වරක්වත් සෑම කථිකාචාර්යවරයෙකු/පුහුණුකරුවෙකු සඳහා ම අනිවාර්ය කර්මාන්ත අත්දැකීමක් සහ තාක්ෂණික පුහුණුවක් ලබා දීම.
3. කථිකාචාර්යවරුන්/පුහුණුකරුවන් කර්මාන්ත ක්ෂේත්‍රයේ පුහුණුවට සහභාගීවීම දිරිගැන්වීම සඳහා විශේෂ දිරි දීමනාවක් ලබා දීම.
4. කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සාධාරණ හා පහසු ගෙවීමේ ක්‍රමයට ඩිජිටල් උපකරණ ලබා දීම.
5. අවශ්‍ය කාර්යමණ්ඩල තනතුරු සහ කාර්ය මණ්ඩල සංඛ්‍යාව හදුනා ගැනීම සහ අවශ්‍ය සංශෝධන, හඳුන්වා දීම සඳහා පවතින ප්‍රතිපත්ති හා චක්‍රලේඛ සමාලෝචනය කිරීම.
6. ඩිජිටල් අධ්‍යාපන විෂයමාලා නිරන්තරයෙන් සහ නිතිපතා යාවත්කාලීන කිරීමේ නම්‍යශීලී යාන්ත්‍රණ/ක්‍රියාවලි සැකසීම සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයතන (සහ අවශ්‍ය නම් ඒක පුද්ගල සමාගම්) සමඟ අඛණ්ඩව සාකච්ඡා කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

### 3.5 අරමුණු අංක 5: සිසුන් සඳහා ඩිජිටල් පරිසරයක්

සෑම අධ්‍යාපන ආයතනයක ම හා වෘත්තීය පුහුණු ආයතනයක ම ශිෂ්‍ය කේන්ද්‍රීය ඩිජිටල් අධ්‍යාපනයක් සහිත පරිසරයක් පැවතීම. සියලු උපාංගවලින් සමන්විත පරිගණක විද්‍යාගාර සපයා දීමෙන් සිසුන්ට ප්‍රමාණවත් සහ සමාන අවස්ථා සලසමින් ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 5.1:**

සියලු ම අධ්‍යාපන ආයතනවල පවතින ඉගෙනුම් සම්පත්වල විෂමතාවය ඩිජිටල් අධ්‍යාපනයේ සෑම මට්ටමකම, ප්‍රධාන ගැටලුවක් වේ.

**ප්‍රතිපත්ති අංක 5.1:**

ඩිජිටල් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සම්පත් (උපකරණ) සියලු ම අධ්‍යාපන ආයතන සතුව තිබිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. සියලු ම අධ්‍යාපන ආයතන මගින් වාර්ෂික සමීක්ෂණ පවත්වා පරිශීලක අවශ්‍යතා නිවැරදිව හඳුනා ගැනීම.
2. විෂයමාලාවට අදාළ ව සියලු උපාංගවලින් සමන්විත පරිගණක විද්‍යාගාර පවත්වාගෙන යාම.
3. අධ්‍යාපන ආයතනවලට අවශ්‍ය උපකරණ සහ ඉඩ පහසුකම් සැපයීම/අදාළ ප්‍රසම්පාදන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.
4. එකම උපකරණ නැවත නැවත ප්‍රසම්පාදනයකින් තොරව, ලබා දී ඇති උපකරණ කණ්ඩායම් කිහිපයකට නිසි පරිදි උපයෝජනය කිරීම.
5. සිසුන්ගේ භාවිතය සඳහා සපයනු ලබන පහසුකම් යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා නිරන්තර නියාමනය හා නඩත්තු සිදු කිරීම.
6. අධ්‍යාපන ආයතන විසින් උපකරණවල තත්ත්වය නිරන්තරයෙන් පරීක්ෂා කර හානියට පත් ඒවා වෙනුවට අළුතින් උපකරණ මිල දී ගැනීමට යෝජනා කිරීම.
7. පාඨමාලා පැවැත්වීම සඳහා අවශ්‍ය උපකරණ/පහසුකම් ප්‍රමාණවත් වේද /වැඩි දියුණු කර තිබේ ද යන්න නිරතුරුව පරීක්ෂා කිරීම.
8. ප්‍රධාන අරමුදල් මූලාශ්‍රයට අමතරව, (හැකි නම්) ඉගෙනුම් සම්පත්/උපකරණ/පහසුකම් සඳහා අරමුදල් සපයා ගැනීමට විකල්ප ක්‍රම සම්පාදන කර ගැනීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.6 අරමුණු අංක 6: ඩිජිටල් අධ්‍යාපනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඉගෙනුම් මූලාශ්‍ර

ශිෂ්‍යයන්, ප්‍රාථමික, ද්විතීයික හෝ තෘතීයික මට්ටම්වල ඉගෙනුම ලැබුව ද, ඔවුන්ගේ ඉගෙනුම් කටයුතු සඳහා අවශ්‍ය ඉගෙනුම් මූලාශ්‍ර (පොත්, සඟරා, වීඩියෝ ආදිය) දැරිය හැකි මිලකට සපයා ගැනීම. එම මූලාශ්‍ර අවශ්‍යතාවයට ගැළපෙන පරිදි ගුණාත්මක තත්ත්වයෙන් පැවතීම හා යාවත්කාලීන විය යුතුය.

**ප්‍රතිපත්ති ගැටලු අංක 6.1:**

ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික යන සෑම මට්ටමකම ඉගෙනුම ලබන සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා සෑම විටම දැරිය හැකි මිලකට ඉගෙනුම් මූලාශ්‍ර සපයා ගත නොහැකි වීම.

**ප්‍රතිපත්ති අංක 6.1**:

සියලු ම අධ්‍යාපන ආයතන විසින් තම සිසුන්ට අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ඉගෙනුම් මූලාශ්‍ර (පොත්, සඟරා, වීඩියෝ ආදිය) ලබා දිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. සියලු ම අධ්‍යාපන ආයතන මගින් වාර්ෂික සමීක්ෂණ පවත්වා ඉගෙනුම් මූලාශ්‍රවල (පොත්, සඟරා, වීඩියෝ ආදිය) පරිශීලක අවශ්‍යතා නිවැරදිව හඳුනා ගැනීම.
2. විෂයමාලාවට අදාළ ව සාම්ප්‍රදායික සහ ඩිජිටල් යන දෙඅංශයෙන් ම සමන්විත පුස්තකාල පවත්වාගෙන යාම.
3. අධ්‍යාපන ආයතනවලට අවශ්‍ය ඉගෙනුම් මූලාශ්‍ර සැපයීම/අදාළ ප්‍රසම්පාදන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.
4. එකම ඉගෙනුම් මූලාශ්‍ර නැවත නැවත ප්‍රසම්පාදනයකින් තොරව ලබා දී ඇති උපකරණ කණ්ඩායම් කිහිපයකට නිසි පරිදි උපයෝජනය කිරීම.
5. සිසුන්ගේ භාවිතය සඳහා සපයනු ලබන ඉගෙනුම් මූලාශ්‍ර යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා නිරන්තර නියාමනය හා නඩත්තු සිදු කිරීම.
6. ප්‍රධාන අරමුදල් මූලාශ්‍රයට අමතරව, (හැකි නම්) ඉගෙනුම් මූලාශ්‍ර සඳහා අරමුදල් සපයා ගැනීමට විකල්ප ක්‍රම සම්පාදන කර ගැනීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.7 අරමුණු අංක 7: ඉගෙනුම් කළමනාකරණ පද්ධති

සෑම අධ්‍යාපන ආයතනයක් ම අධ්‍යාපන ක්‍රියාවලියේ විශිෂ්ටත්වය සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMSs) භාවිතා කිරීම.

### ප්‍රතිපත්ති ගැටලු අංක 7.1:

ඇතැම් අධ්‍යාපන ආයතන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ විශිෂ්ටත්වය සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMSs) භාවිත නොකිරීම.

### ප්‍රතිපත්ති අංක 7.1:

සියලු ම අධ්‍යාපන ආයතන තම ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා සුදුසු පරිදි ඉගෙනුම් කළමනාකරණ පද්ධති භාවිත කළ යුතුය.

### ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:

1. අධ්‍යාපන පාඨමාලා සඳහා අවශ්‍ය පරිදි ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) හඳුන්වා දීම.
2. ගුරුවරුන් හා සිසුන් යන දෙපාර්ශවයට ම ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMSs) භාවිතය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.
3. අධ්‍යාපන ආයතන මගින් ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMSs) යාවත්කාලීන ව පවත්වාගෙන යාම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.8 අරමුණු අංක 8: ස්වයං ඉගෙනුම හා ඒ සඳහා පහසුකම් සැලසීම

ඩිජිටල් අධ්‍යාපනය පන්ති කාමරවලට පමණක් සීමා කළ නොහැකි අතර එසේ සීමා කළ යුතු ද නැත. එහෙත් ඩිජිටල් තාක්ෂණ කුසලතා සහිත අනාගත වෘත්තිකයන් බවට පත් වීම සඳහා ප්‍රධාන විෂයන් පිළිබඳව මෙන්ම අනෙකුත් විෂය ක්ෂේත්‍රවලට අදාළ ව තම දැනුම වැඩිදියුණු කරගනිමින් ස්වයං අධ්‍යනයේ යෙදීමට සිසුන් උනන්දු කරවීම.

### ප්‍රතිපත්ති ගැටලු අංක 8.1:

ස්වයං අධ්‍යයනය, ඩිජිටල් අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය සංරචකයකි. එහෙත් බොහෝවිට ඊට නිසි පිළිගැනීමක් නොලැබෙන අතර ඇතැම් පාඨමාලා සඳහා ප්‍රමාණවත් පරිදි ස්වයං අධ්‍යාපන සංරචක ඇතුළත් වී නොමැති වීම.

### ප්‍රතිපත්ති අංක 8.1:

ස්වයං අධ්‍යයනය ඩිජිටල් අධ්‍යාපනයේ තීරණාත්මක සාධකයකි.ඩිජිටල් තාක්ෂණ කුසලතා සහිත අනාගත වෘත්තිකයන් බවට පත්වීම සඳහා ස්වයං අධ්‍යනයට අදාළ යටිතල පහසුකම් සිසුන්ට සැපයිය යුතුය.

### ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:

1. විෂයමාලා නැවත පරීක්ෂාවේ දී (Revisit) හා සංශෝධනය කිරීමේ දී (Revised) අදාළ සියලු පාඨමාලා සඳහා ස්වයං අධ්‍යයන සංරචක හඳුන්වා දීම.
2. සිසුන් විසින් අත්‍යවශ්‍ය ස්වයං අධ්‍යයන සංරචක සම්පූර්ණ කරනු ලබන බව අධීක්ෂණය කිරීම සහ තහවුරු කර ගැනීම.
3. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් සඳහා අවශ්‍ය පරිදි සියලු පාඨමාලා ,සම්පත් හා ඇගයීම් ක්‍රමවේද අවශ්‍ය පරිදි සම්පාදනය කිරීම.
4. විෂය සම්බන්ධ ස්වයං අධ්‍යයන කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් ස්වයං අධ්‍යයන ක්‍රියාකාරකම් ශ්‍රේණිගත කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම.
5. මාර්ගගත ස්වයං ඇගයීම් විභාග ක්‍රමවේද හඳුන්වා දීම.
6. නැණසල වැඩසටහන ස්වයං තිරසර ඉගෙනුම් ආකෘතියක් බවට පරිවර්තනය කිරීම.


මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.9 අරමුණු අංක 9: මෘදු කුසලතා සංවර්ධනය

මෘදු කුසලතා සංවර්ධනය ඩිජිටල් අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය සංරචකයකි. ඩිජිටල් අධ්‍යාපනයේ දී දෘඪ කුසලතා හා සමගාමීව සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනයක් ද සිදුවිය යුතුය. සන්නිවේදන කුසලතා , අන්තර් පුද්ගල සබඳතා, ඉදිරිපත් කිරීමේ කුසලතා, කණ්ඩායම් හැගීම, නායකත්වය කුසලතා  ආදිය මෘදු කුසලතා යටතට ගැනේ.

**ප්‍රතිපත්ති ගැටලු අංක 9.1:**

ඇතැම් විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ දෘඪ කුසලතා හා සමගාමීව මෘදු කුසලතා සංවර්ධනය විය යුතු බව අවබෝධ කරගෙන නොමැති බැවින් මෘදු කුසලතා සංවර්ධනය ඩිජිටල් කුසලතා පුහුණුවේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සලකනු නොලැබේ.

**ප්‍රතිපත්ති අංක 9.1:**

අධ්‍යාපන පාඨමාලාවල අත්‍යාවශය අංගයක් ලෙස මෘදු කුසලතා සංවර්ධනය ඇතුළත් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. සියලු විෂයමාලාවල සන්නිවේදන කුසලතා, අන්තර් පුද්ගල සබඳතා,කණ්ඩායම් හැගීම,නායකත්ව කුසලතා, ඉදිරිපත් කිරීමේ කුසලතාව ආදිය සිද්ධි පාදක ඉගෙනුම් ඇසුරෙන් සිදුකිරීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීම.
2. සෑම වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවකට ම අනිවාර්යය මොඩියුල ලෙස ඉංග්‍රීසි භාෂා හැකියා වර්ධනය කිරීමේ මොඩියුල ක්‍රියාත්මක කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.10 අරමුණු අංක 10: අධ්‍යාපන ආයතන සඳහා ඩිජිටල් කළමනාකරණ තොරතුරු පද්ධති

සියලු ම අධ්‍යාපන ආයතනවල පරිපාලන හා කළමනාකරණ කටයුතු සඳහා අංගසම්පූර්ණ කළමනාකරණ තොරතුරු පද්ධති භාවිතා කිරීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 10.1:**
මේ වන විට අධ්‍යාපන ආයතන කිහිපයක් පමණක් කළමනාකරණ තොරතුරු පද්ධති භාවිතා කිරීම නිරීක්ෂණය වේ. ඒ හේතුවෙන් පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරුවල හිඟයක් ඇති වීම, කළමනාකරණ තීරණ ගැනීමට ප්‍රමාද වීම සහ සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට නොහැකිවීම ආදී ගැටලු මතුවීම.

**ප්‍රතිපත්ති අංක 10.1:**
සියලු ම අධ්‍යාපන ආයතනවල පරිපාලන කටයුතු කළමනාකරණ තොරතුරු පද්ධති මගින් සිදු කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. සියලු ම අධ්‍යාපන ආයතනවල අධ්‍යාපන සහ පරිපාලන කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා එම ආයතනවලට පුළුල් කළමනාකරණ පද්ධති ලබා දීම.


මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

### 3.11 අරමුණු අංක 11: පරිපාලන කාර්ය මණ්ඩලයේ ඩිජිටල් කුසලතා

සියලු ම අධ්‍යාපන ආයතනවල පරිපාලකයින්ට සිය දෛනික කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය පද්ධති හා යෙදවුම් මෙහෙයවීමට අවශ්‍ය ඩිජිටල් කුසලතා පිළිබඳව නිපුනත්වයක් ලබා දීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 11.1:**
අධ්‍යාපන ආයතනවල පරිපාලන කාර්ය මණ්ඩල ඩිජිටල් කුසලතාවලින් සන්නද්ධ වී නොමැති බැවින් ඇතැම් විට පාසල් පරිපාලන කටයුතු හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී අත්‍යාවශ්‍ය අංගයක් ලෙස ඩිජිටල් කුසලතා නොසැලකීම.

**ප්‍රතිපත්ති අංක 11.1:**
සියලු ම අධ්‍යාපන ආයතනවල පරිපාලන හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායකවන කාර්ය මණ්ඩලයේ ඩිජිටල් කුසලතා නිසි ලෙස හඳුනා ගත යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. එදිනෙදා පරිපාලන හා කළමනාකරණ කටයුතුවලට අවශ්‍ය ඩිජිටල් කුසලතා සංවර්ධනය සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීම.
2. පරිපාලන හා කළමනාකරණ කාර්යයන්ට අදාළ ව ඩිජිටල් පහසුකම් භාවිතයේ දී තොරතුරු තාක්ෂණ සන්නිවේදන විෂය විශේෂඥයින්ගේ නිර්දේශමත කටයුතු කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.12 අරමුණු අංක 12: මාර්ගගත ඉගෙනුම

සාමාන්‍ය ක්‍රමවේදය යටතේ අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවල ඉගෙනුම් ක්‍රියාකාරකම් ආවරණය කිරීම සඳහා සියලු සිසුන්ට පහසුකම් පැවතිය යුතුය. එහිදී භූගෝලීය පිහිටීම,ආර්ථිකය මත සමාජීය මට්ටම නොසලකා සම්ප්‍රදායික පන්තිකාමර අධ්‍යාපනයට සමීප අඛණ්ඩ හා විධිමත් අධ්‍යාපනයක් මාර්ගගත ව ලබා දීමට අවශ්‍ය යටිතල පහසුකම් (උපකරණ හා උපාංග, සංඥා ආවරණ, අන්තර්ජාල පහසුකම් ආදිය) රජය මගින් සම්පාදනය කිරීම.

### ප්‍රතිපත්ති ගැටලු අංක 12.1:

මාර්ගගත අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් හා ගුණාත්මක අන්තර්ජාල සබඳතාවයක් පැවතීම අත්‍යවශ්‍ය වුවත් සංඥා ආවරණ නොමැති වීම, භූගෝලීය විෂමතා වැනි හේතුමත දිවයින ම ආවරණය වන ඵලදායී අන්තර්ජාල සබඳතා නොපැවතීම.

### ප්‍රතිපත්ති අංක 12.1:

අන්තර්ජාල සබඳතා සුළු පිරිසක් පමණක් ආවරණය වන සුඛෝපභෝගී සේවාවක් /පහසුකමක් නොවිය යුතු අතර භූගෝලීය පිහිටීම,සමාජ ආර්ථික මට්ටම හා වෙනත් භේද නොසලකා සියලු ම සිසුන්ට දැරිය හැකි මිලකට මාර්ගගත අධ්‍යාපනය සඳහා ප්‍රවේශ පහසුකම් සැපයිය යුතුය.("සැමට අන්කර්ජාල සබඳතා'')

### ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:

1. සෑම දරුවකුට ම නිවසේ දී සහ අධ්‍යාපන ආයතනයේ දී අඩු මිලට අඛණ්ඩ හා ප්‍රබල අන්තර්ජාල පහසුකම් සඳහා ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම හා දිවයින ම ආවරණය වන පරිදි සංඥා පහසුකම් තහවුරු කිරීම.
2. මාර්ගගත අධ්‍යාපන අවශ්‍යතා සඳහා ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම/ වැඩි දියුණු කිරීම.
3. අධ්‍යාපනික අරමුණු සඳහා අන්තර්ජාල ප්‍රවේශය සහ භාවිතය තහවුරු කිරීම සඳහා අන්තර්ජාල සේවා කරුවන් මගින් දැරිය හැකි මිලකට දිවයින පුරා අන්තර්ජාල සබඳතා පුළුල් කිරීමට ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.
4. අන්තර්ජාල පහසුකම් ඇතුලු නවීන තාක්ෂණයෙන් සමන්විත පොදු මධ්‍යස්ථාන සෑම ගමකම ස්ථාපිත කිරීම සහ අවශ්‍යතාව අනුව ගෙවීමේ පදනම මත හෝ නොමිලයේ හෝ සේවා සැපයීමට උනන්දු කරවීම.
5. සිසුන් සහ ගුරුවරුන් සඳහා නොමිලයේ හෝ දැරිය හැකි මිලකට හෝ අන්තර්ජාල පැකේජ ලබා දීමේ වැඩපිළිවෙලක් දිවයින පුරා දියත් කිරීමට අන්තර්ජාල සේවා සපයන්නන් දිරිගැන්වීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

**ප්‍රතිපත්ති ගැටලු අංක 12.2 :**

මාර්ගගත අධ්‍යාපනයේ දී අන්තර්ජාල සම්බන්ධතා මෙන්ම උපාංග ද තීරණාත්මක සාධකයකි.එහෙත් බොහෝ දෙමව්පියන්ට තම දරුවන් උදෙසා උපාංග මිල දී ගැනීමට නොහැකි වීම.

**ප්‍රතිපත්ති අංක 12.2:**

සෑම දරුවකුට ම ඔවුන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම නොසළකා මාර්ගගත අධ්‍යාපන ලබා දීම රජයේ වගකීම වන බැවින් ඒ සඳහා ගැළපෙන උපාංග ලබා ගැනීමට ඔවුන්ට ඉඩසැලසීම , මාර්ගගගත අධ්‍යාපනයට "එක් ශිෂ්‍යකු සඳහා එක් උපාංගය බැගින්" ලෙස දිගුකාලීන වැඩපිළිවෙළත් සැකසිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. උපාංග මිල දී ගැනීමට නොහැකි සිසුන්ට නොමිළයේ හෝ දැරිය හැකි මිලකට හෝ උපාංග ලබා දීම.
2. මාර්ගගත ඉගැන්වීම් කටයුතුවල නියැළී සිටින සෑම ගුරුවරයකුට ම සුදුසු උපාංග ලබා දීම.
3. සිසුන් වැඩි පිරිසකට පහසුකම් සැලසෙන පරිදි පාසල් සඳහා උපාංග සම්පාදනය කිරීම.
4. දේශීය වාණිජ්‍ය බැංකු සමග එක්ව ගුරුවරුන් සහ ශිෂ්‍යයන් දෙපාර්ශවයට ම උපාංග මිල දී ගැනීමට ණය යෝජනා ක්‍රම සකස් කිරීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 12.3:**

මාර්ගගත අධ්‍යාපනය ඊට අවේණික සීමා හේතුවෙන් සාම්ප්‍රදායික පන්ති කාමරයේ අධ්‍යාපනයට සම විකල්පයක් නොවන බැවින් සිසුන්ට, ගුරුවරුන්ට හා දෙමාපියන්ට නිරන්තර ගැටලු මතුවීම.

**ප්‍රතිපත්ති අංක 12.3:**

අවසන් ප්‍රතිඵලය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී පන්ති කාමර තුළ සිදු කරන සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවේදයට සමාන ව හෝ එයට සමීපව මාර්ගගත ඉගැන්වීම් කටයුතු සිදු විය යුතුය. සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවේදය මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය බවට පත් වීම නිසා සිසුන් පීඩාවට පත් විය යුතු නැත.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. මාර්ගගත අධ්‍යාපනය ඉගැන්වීම, ඉගෙනීම, ඇගයීම, පර්යේෂණය සහ පරිපාලනය සඳහා පාලන ප්‍රතිපත්තියක් සකස් කිරීම.
2. මාර්ගගත අධ්‍යාපනය සඳහා පොදු මාර්ගෝපදේශ හඳුන්වා දීම.
3. නිවැරදි තක්සේරුකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී මතුවන දුෂ්කරතා මගහරවා ගැනීමට විකල්ප ඇගයීම් ක්‍රමවේද හඳුන්වා දීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

4. මාර්ගගත අධ්‍යාපන කටයුතු අධීක්ෂණයට පහසුකම් සැපයීම. ඒ මගින් ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහයෝගයෙන් මාර්ගගත විභාග, ඉගෙනුම් කළමනාකරණ පද්ධති සමපදස්ථ කර සමාලෝචන ක්‍රමවේද ආදිය සකස් කර ගැනීම.
5. දීර්ඝ සැසි පැවැත්වීමෙන් සිසුන් සහ ගුරුවරුන් වෙහෙසට පත්වීම වැළැක්වීම සඳහා මිශ්‍ර ඉගෙනුම් මෙවලම් නිවැරදිව භාවිතා කරමින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සමග (දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආදිය) ශිෂ්‍යයා සම්බන්ධ කර ගැනීමට හැකි වන ආකාරයේ මාර්ගෝපදේශ සකස් කිරීම. උදා: උසස් අධ්‍යාපනය ලබන සිසුන් සඳහා සැසි කාලය පැය 1-2 දක්වා සීමා කළ යුතුය
6. ස්වයං ඉගෙනුම් ශිල්ප ක්‍රම වැඩි දියුණු කිරීම සහ විෂය මාලාව අනුව දේශන කාලය අඩු කිරීම.
7. මාර්ගගත අධ්‍යාපනයේ ගැටලු නිරාකරණය කිරීම. (විශේෂයෙන් බොහෝ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍ර වැඩි ප්‍රායෝගික නැඹුරුවක් තිබෙන බැවින්)
   - සියලු ම පුහුණුකරුවන්ට ඩිජිටල් හා විද්‍යුත් අධ්‍යාපනික කුසලතා පිළිබඳ පුහුණුව ලබා දීම.
   - දුරස්ථ ඉගෙනුම් පරිසරය තුළ LMS (asynchronous) මගින් සියලු ම මාර්ගගත අධ්‍යාපන (synchronous) වැඩසටහන් ඌන පූරණය කිරීම.
   - ජාතික මට්ටමේ විද්‍යුත් ඉගෙනුම් සම්පත් සංවර්ධනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
   - ප්‍රායෝගික නැඹුරුවක් සහිත මෘදුකාංග හඳුන්වාදීම.
   - සියලු සිසුන්ට දැනුම හුවමාරු කර ගැනීම සඳහාත් ප්‍රශ්න යොමු කිරීම සඳහාත් මාර්ගගත සංවාද මණ්ඩපයක් (Online Forum) නිර්මාණය කිරීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 12.4:**

මාර්ගගත අධ්‍යාපනය සඳහා අන්තර්ජාල පහසුකම් සහ උපාංග තිබීම අත්‍යවශ්‍ය මුත් එය පමණක් සපුරා තිබීම ප්‍රමාණවත් නොවේ. එය සාර්ථකත්වයට තවත් පහසුකම් රැසක් අත්‍යාවශ්‍ය වේ. මාර්ගගත අධ්‍යාපන පද්ධති එක් තීරණාත්මක සාධකයකි. ශ්‍රී ලංකාව තුළ මාර්ගගත ඉගෙනුම් පද්ධති නිර්මාණය වුව ද, ඔවුන්ට ඒවා හඳුන්වා දීම අත්‍යවශ්‍ය වේ. මෑතවින් සංවර්ධනය වූ මාර්ගගත ඉගෙනුම් පද්ධති ශ්‍රී ලංකාවේ පැවතිය ද ඒ සඳහා සිසුන්ගේ පිළිගැනීම අඩු බැවින් ඒ සඳහා ශිෂ්‍ය ප්‍රජාව තුළ ඇති පිළිගැනීම තහවුරු කිරීම අත්‍යාවශ්‍ය වේ.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

**ප්‍රතිපත්ති අංක 12.4:**

ඉ තක්සලාව (e-Thaksalawa) ගුරු ගෙදර වැනි අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හදුන්වා දෙන ලද ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධති සහ ගුවන්විදුලි ,රූපවාහිනී වැඩසටහන් ජාතික මට්ටමේ විද්‍යුත් ඉගෙනුම් ප්‍රවේශ ලෙස පිළිගත යුතු අතර ඒ පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. ගුරුගෙදර සහ ඉ-තක්සලාව වැනි වැඩසටහන් පිළිබඳ ව සමාජයේ දැනුවත්භාවය අඩුවීමට පිළියමක් වශයෙන් ජනමාධ්‍ය, සමාජ මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය වැනි ක්‍රම භාවිතයෙන් ත්‍රෛභාෂාවෙන් ම දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරීම.
2. ගුරුගෙදර සහ ඉ-තක්සලාව වැනි වැඩසටහන් සඳහා ගුණාත්මක හා අන්තර් ක්‍රියාකාරී විෂයය අන්තර්ගතයන් නිර්මාණය කිරීම

**ප්‍රතිපත්ති ගැටලු අංක 12.5:**

මාර්ගගත ඉගෙනුමේ දී ගුරුවරුන් සහ සිසුන් යන දෙපාර්ශවය ම තාක්ෂණික ගැටලුවලට මුහුණ දීම මෑත කාලීන අත්දැකීමකි.මේ හේතුවෙන් ඉගෙනුම් කටයුතු අඩාල වීම බහුලව සිදු වේ.

**ප්‍රතිපත්ති අංක 12.5:**

මාර්ගගත අධ්‍යාපන වැඩසටහන් අවම තාක්ෂණික ගැටලු මතුවීමකින් සහ අවම කාල නාස්තියකින් යුතුව ක්‍රියාක්මක කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. මාර්ගගත අධ්‍යාපනය ලබා දීමේ දී පැන නගින ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට ක්ෂණික ඇමතුම් උපකාරක සේවයක් ක්‍රියාත්මක කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.13 අරමුණු අංක 13: ඩිජිටල් මෙවලම් භාවිතා කිරීමේ කුසලතා (ගුරුවරුන්/අධ්‍යයන කාර්ය මණ්ඩලය)

සියලු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාවලින් සන්නද්ධ වීම. තව ද ඔවුන්ට ඉගැන්වීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් ඩිජිටල් මෙවලම් හා මෘදුකාංග ලබා දීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 13.1:**
ඇතැම් අධ්‍යයන කාර්ය මණ්ඩල එදිනෙදා අනිවාර්යයෙන් අවශ්‍ය වන ඩිජිටල් තාක්ෂණික මෙවලම් පිළිබඳ අවබෝධයක් ලබා නොමැති වීම.

**ප්‍රතිපත්ති අංක 13.1 :**
සියලු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට තම ක්ෂේත්‍රයට අදාළ ව ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමට හැකි විය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. පරිපාලකයින්, ගුරුවරුන් සහ නිලධාරීන්ගේ ඩිජිටල් කුසලතා සාක්ෂාත් කිරීම වාර්ෂිකව ඇගයීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
2. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය ඩිජිටල් තාක්ෂණ කුසලතා ඇගයීමේ අනිවාර්ය සංරචක හඳුන්වාදීම.
3. ඩිජිටල් සාක්ෂරතාවය සහතික කිරීම සඳහා එක් එක් මට්ටමට අදාළ ව මොඩියුල කාණ්ඩයන් සකස් කිරීම සහ එම මොඩියුල සියලු පරිපාලකයින්, ගුරුවරුන් සහ නිලධාරීන් විසින් අනිවාර්යයයෙන්ම සම්පූර්ණ කළ යුතු වීම.
4. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිතා කළ හැකි ඩිජිටල් උපාංග පරාසය හඳුනා ගැනීම



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.14 අරමුණු අංක 14: ඩිජිටල් මෙවලම් භාවිතය පිළිබඳ කුසලතා (ශිෂ්‍යයන්)

සියලු සිසුන් අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීමට අවශ්‍ය හැකියාව ලබා ගැනීම.

### ප්‍රතිපත්ති ගැටලු අංක 14.1:

ඩිජිටල් මෙවලම් භාවිතය සඳහා අවශ්‍ය නිපුණතා හා නිසි අවබෝධය නොමැති වීම මගින් සිසුන්ට ඉගෙනුම් ක්‍රියාකාරකම්වල දී දුෂ්කරතා මතු විය හැක.

### ප්‍රතිපත්ති අංක 14.1:

සියලු සිසුන් අත්‍යාවශ්‍ය ඩිජිටල් කුසලතා ලබා ගැනීම සහ ඒ මගින් මාර්ගගත ඉගෙනුම් මෙවලම් ඵලදායීව භාවිත කිරීම කළ යුතුය.

### ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:

1. පහසුවෙන් ප්‍රවේශ විය හැකි ක්‍රමවේද සහ ප්‍රායෝගික ඇගයීම් ක්‍රම සහිත පුහුණු අන්තර්ගත භාවිතයෙන් සිසුන්ගේ ඩිජිටල් කුසලතා වර්ධනය කරමින් සිසුන්ගේ ඩිජිටල් කුසලතා පරතරය අවම කිරීම.
2. විශ්ව විද්‍යාල මට්ටමින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ඉලක්ක කර ගත් විශේෂිත පුහුණු සැසි හඳුන්වා දී ඒවා අනිවාර්ය කිරීම
3. නව්‍ය තාක්ෂණය හඳුන්වා දීම සහ ඒ සම්බන්ධ පුහුණුව ලබා දීම සඳහා විශේෂ ඒකකයක් සෑම විශ්වවිද්‍යාලයක ම ස්ථාපිත කිරීම.( ඉංග්‍රිසි ඉගැන්වීමේ ඒකක ආකාරයෙන්)



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.15 අරමුණු අංක 15: ඩිජිටල් අවකාශය තුළ සුරක්ෂිත බව

ගුරුවරුන් හා පරිපාලකයින් විසින් සයිබර් අනතුරු හඳුනා ගැනීම මගින්, අධ්‍යාපනය සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිතා කරන සියලු සිසුන්ට සුරක්ෂිත ඩිජිටල් අවකාශයක් තහවුරු කිරීම හා ඒ සඳහා විධිමත් රැකවරණයක් සැපයීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 15.1:**
ඇතැම් පාර්ශව විසින් අන්තර්ජාලය අවභාවිතා කිරීම හේතුවෙන් සිසුන් සයිබර් අවකාශය තුළ අනතුරට ලක්වීමට හා අන්තර්ජාල ගොදුරු බවට පත්වීමට ඇති ඉඩකඩ වැඩි වී ඇත.

**ප්‍රතිපත්ති අංක 15.1:**
ගුරුවරුන් ,දෙමාපියන්,භාරකරුවන් සහ සියලු ම අධ්‍යාපන ආයතන පරිපාලකයන්ගේ සමූහික ප්‍රයත්නයන් හරහා ප්‍රාථමික , ද්වීතික හා තෘතීක යනාදී සෑම මට්ටමක ම සිටින සිසුන් සයිබර් අනතුරු හෝ ඩිජිටල් අවකාශය තුළ ඇතිවන අපහසුතාවලින් සුරක්ෂිත විය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. සයිබර් තර්ජනවලින් සිසුන් ආරක්ෂා කිරීම ඩිජිටල් අධ්‍යාපනයේ ප්‍රධාන අවශ්‍යතාවයක් ලෙස සියලු ම අධ්‍යාපන ආයතන විසින් හඳුනා ගැනීම.
2. සෑම අධ්‍යාපන ආයතනයක්ම දෙමාපිය භාරකරුවන් සමග සමීප සබඳතා පවත්වමින් සිසුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මතුවන ඕනෑම ගැටලුවක දී නිසි අවධානය යොමු කිරීම.
3. එවැනි ඕනෑම සිදුවීමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වැනි ආයතන වෙත කඩිනමින් වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් සියලු අධ්‍යාපන ආයතන බලධාරීන් විසින් පවත්වාගෙන ගෙන යා යුතුය.
4. සියලු මාර්ගගත පද්ධති වරින් වර අධීක්ෂණ කර වෙනත් පාර්ශවවලට අවභාවිත කළ හැකි අවධානම් තත්ව අවම කිරීමට අධ්‍යාපන බලධාරීන් විසින් ක්‍රියාමාර්ග ගැනීම.
5. අසාදු ලේඛනගත වෙබ් අඩවිවලට සිසුන්ගේ ප්‍රවේශ සීමා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
6. අධ්‍යාපන ක්ෂේත්‍රයට හදිසි ප්‍රතිචාර කණ්ඩායමක් (CERT) ස්ථාපිත කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

### 3.16 අරමුණු අංක 16: දෙමාපියන්/භාරකරුවන් දැනුවත් කිරීම.

දෙමාපියන් සහ භාරකරුවන් ඩිජිටල් අධ්‍යාපනයේ අවශ්‍යතාව පිළිබඳව දැනුවත් වී ඒ සඳහා හිතකර පරිසරයක් නිවස තුළ සකස් කිරීම සහ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා හැකි උපරිම සහය දැක්වීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 16.1:**
සිය දරුවන්ගේ ඩිජිටල් අධ්‍යාපන අවශ්‍යතා සහ ඒ සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ව ඇතැම් දෙමාපියන්/භාරකරුවන් දැනුවත් නොවීම.

**ප්‍රතිපත්ති අංක 16.1:**
අධ්‍යාපනයේ නිරත සෑම සිසුවෙකුගේම දෙමාපියන්/භාරකරුවන් ඩිජිටල් අධ්‍යාපනයේ අවශ්‍යතා පිළිබඳ දැනුවත් කිරීම සහ දරුවන්ට ඒ සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සිදු කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් වැනි ජාතික මට්ටමේ පාර්ශකරුවන්ගේ සම්බන්ධ කර ගනිමින් දෙමාපියන්/භාරකරුවන් දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කිරීම.
2. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතයෙන් පුළුල් ප්‍රචාරක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.17 අරමුණු අංක 17: තිරසර හා පරිසර හිතකාමී ඩිජිටල් සංවර්තනය

සෑම අධ්‍යාපන ආයතනයක් ම තිරසර හා පරිසර හිතකාමී ඩිජිටල් සංවර්තන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සහ විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කිරීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 17.1:**

පරිගණක සහ අනෙකුත් උපාංග නිසි කළමනාකරණයෙන් තොරව පරිසරයට බැහැර කිරීම තුළින් දිගුකාලීන පාරිසරික ගැටලු මතු වීම.

**ප්‍රතිපත්ති අංක 17.1:**

පරිසර හිතකාමී සහ තිරසර ඩිජිටල් අධ්‍යාපන ක්‍රියාවලියක් තුළින් විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ යුතුය/අවම පරිසර හානියක් ඇති වන පරිදි බැහැර කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. මධ්‍යම පරිසර අධිකාරයේ (CEA) මගපෙන්වීම යටතේ විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය / බැහැර කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.18 අරමුණු අංක 18: මෘදුකාංග භාවිතය

අධ්‍යාපන ආයතනවල ඉගෙනුම් ක්‍රියාකාරකම් සහ කළමනාකරණයට භාවිත කරන මෘදුකාංග අදාළ කාර්යයට ගැළපෙන ප්‍රයෝජනවත් ,යාවත්කාලීන සහ බලපත්‍ර සහිත (විවෘත හා නිදහස් මෘදුකාංග හැර) මෘදුකාංග වීම.

**ප්‍රතිපත්ති ගැටලු අංක 18.1:**
අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ භාවිත කරන බොහෝ මෘදුකාංග අදාළ කාර්යයන්ට ගැළපෙන , ප්‍රයොජනවත් යාවත්කාලීන සහ බලපත්‍ර සහිත මෘදුකාංග නොවීම.

**ප්‍රතිපත්ති අංක 18.1:**
භාවිත කරන සියලු මෘදුකාංග අදාළ කාර්යයට ගැළපෙන ප්‍රයෝජනවත්, යාවත්කාලීන සහ බලපත්‍ර සහිත මෘදුකාංග විය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය**:

1. ඉගෙනුම් හා කළමනාකරණ කටයුතු සඳහා යොදා ගත යුතු මෘදුකාංග විෂය දැනුම සහිත කමිටුවක් මගින් තෝරා ගැනීම
2. භාවිතකරන සියලු මෘදුකාංගවල උපයෝගීතාවය තහවුරු කිරීම සහ බලපත්‍ර නිරන්තර යාවත්කාලීන කිරීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.

## 3.19අරමුණු අංක 19: ඩිජිටල් සංවර්තනයට ප්‍රමුඛතාව

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයින් ක්‍රියාත්මක කරන්නන් ඇතුළු තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සිටින සියලු පාර්ශවකරුවන් අධ්‍යාපන ඩිජිටල් සංවර්තන ක්‍රියාවලියට නිසි ප්‍රමුඛතාවය ලබා දීම.

**ප්‍රතිපත්ති ගැටලුව 19.1:**
අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය සෑම විට ම බලධාරීන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ නිසි පිළිගැනීමකට ලක් නොවීම.

**ප්‍රතිපත්ති අංක 19.1:**
ඩිජිටල් සංවර්තනය සෑම අධ්‍යාපන අයතනයක්ම ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය:**

1. ප්‍රතිපත්ති සම්පාදකයින්, ක්‍රියාවට නංවන්නන් ඇතුළු සියලු ම බලධාරීන් සහ පාර්ශ්වකරුවන් විසින් අධ්‍යාපනයයේ ඩිජිටල් සංවර්තනය ක්‍රියාවට නැංවීම ප්‍රමුඛතාවක් ලෙස හඳුනා ගැනීම.



මෙම ලේඛනය කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, ප්‍රචාරණය කිරීම, පිටපත් කිරීම, හෙළිදරව් කිරීම, වෙනස් කිරීම, බෙදා හැරීම සහ හෝ ප්‍රකාශනය කිරීම සපුරා තහනම් වේ.